ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1979 අංක 36 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 මැයි මස 31 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1979 ජූනි මස 08 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 20 යි　　　　තැපැල් ගාස්තුව ; ශත 25 යි

# 1979 අංක 36 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1979 මැයි මස 31 වන දින]

එල්.ඩී.—ඕ. 19/79

**1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1979 අංක 36 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

2. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 457 වන වගන්තියේ (8) වන උපවගන්තියට ඉක්බිතිව ම මෙහි පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුලත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — 1979 අංක 15 දරන පනතේ 457 වන වගන්තිය සංශෝධනය කිරීම.

"(8අ) අධිචෝදනා පත්‍රයක් මත නියමිත දිනයට කලින් මහාධිකරණයෙහි නඩු කටයුතු පවරා ඇත්තා වූ ද, ඒ අධිචෝදනා පත්‍රයේ සඳහන් වරද හෝ එහි වැරදි එකකට වැඩි ගණනක් සඳහන් ව ඇති අවස්ථාවක, ඉන් යම් වරදක් හෝ 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ දෙවන උපලේඛනයේ දක්වා ඇති වැරදි පිළිබඳ ලැයිස්තුවට ඇතුලත් වන වරදක් නොවන්නා වූ ද, නියමිත දිනයට ඉහතින් ම වූ දිනයෙහි ඒ නඩුකටයුතු විනිශ්චයට භාජනව පවත්නා වූ ද අවස්ථාවක, ඒ අධිචෝදනා පත්‍රය මත වූ නඩු විභාගය, ජූරි සභාවක් නොමැතිව තනිව නඩු විභාග කරන මහාධිකරණ විනිශ්චයකාරවරයකු ඉදිරිපිට පැවැත්විය යුතු ය.

(8ආ) මේ සංග්‍රහයේ විධිවිධාන යටතේ මහාධිකරණය විසින් ම පමණක් නඩු විභාග කරනු ලැබිය යුතු වරදක් සම්බන්ධයෙන්, නියමිත දිනයට පෙරාතුව මහේස්ත්‍රාත් අධිකරණයක නඩුකටයුතු පවරා ඇත්තා වූ ද නියමිත දිනයට ඉහතින්ම වූ දිනයෙහි ඒ නඩුකටයුතු විනිශ්චයට භාජනව පවත්නා වූ ද අවස්ථාවක, මේ සංග්‍රහයේ හෝ වෙනත් යම් නීතියක හෝ විධිවිධාන කෙසේ වුව ද ඒ කාරණය විභාග කොට තීරණය කිරීමට හෝ දිගට ම විභාග කොට නිම කිරීමට හෝ ඒ මහේස්ත්‍රාත් අධිකරණයට අධිකරණ බලය තිබිය යුතු ය.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.